භාවිතයෙන් ඉවත්කරන ලද කාර්යාලීය උපකරණ
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - ආණමඩුව

අනු. අංකය	*භාණ්ඩ වර්ගය*
01	පරිගණක CPU 01 යි
02	පරිගණක CPU 02 යි
03	කුෂන් පුටු 02 යි
04	රෙකෝඩරය 01 යි

11-73

මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස

රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2026.11.26** වන දින **මධ්‍යාහ්න 12.00**ට පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම්පාන්නෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දීම මුදල් ගෙවා, අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදල් වලින් කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ඩබ්ලිව්. එම්. එච්. අධි
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
පිලැස්ස.

2026 ඔක්තෝබර් මස 30 වන දින,
පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*නඩු අංකය*	*පීආර් අංකය*	*භාණ්ඩය*
01	AR 652/26	1387/26	(I) සවල් 01 (II) යකඩ බාල්දි 02
02	PLS/MC/MS/02165/26	1445/26	සවල් 01
03	PLS/MC/PC/00308/26-B	219/26	වක් පිහි
04	PLS/MC/PC/01965/26-B	381/26	තඹ කම්බි කැබලි (පිලිස්සුණු) කි.ග්‍රෑ. 10 පමණ
05	PLS/MC/EX/01810/26	1246/26	බූලි 01
06	PLS/MC/EX/01843/26	1271/26	කෑන් 01
07	PLS/MC/EX/01058/26	410/26	කෑන් 01
08	PLS/MC/EX/01541/26	408/26	කෑන් 01
09	PLS/MC/EX/01543/26	372/26	කෑන් 01
10	PLS/MC/EX/02056/26	717/26	කෑන් 01
11	PLS/MC/EX/02057/26	718/26	කෑන් 01
12	PLS/MC/MS/01710/26	1242/26	වැලි කියුබ් 01
13	PLS/MC/MS/02165/26	1444/26	වැලි කියුබ් 1/4
14	PLS/MC/MS/01983/26	1356/26	පස් කියුබ් 01
15	PLS/MC/MS/02064/26	1413/26	බොරළු පස් කියුබ් 3
16			වීදුරු බෝතල් 240
17	AR/641/26	2140/25	රන් පැහැති මාලය (බර ග්‍රෑම් 5.03) රන් පැහැති පෙන්ඩනය (බර ග්‍රෑම් 0.74)
18	AR/1374/25	1740/24	ගුරු පාට ගල් කැබැල්ල ජාගුන් (Zircon) - බර ක්‍රාත් 2.70 කොළ පාට ගල් කැබැල්ල ජාගුන් (Zircon) - බර ක්‍රාත් 3.18 රෝස පාට ගල් කැබැල්ල රබහ (Garnet) - බර ක්‍රාත් 1.82
19	90625	2398/20	CP DAA 7063 කුඩා ලොරි රථය
20	PLS/MC/DD/00705/26	159/26	BEW 4453 යතුරු පැදිය

මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල

රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජසන්තක කිරීමට යටත් වූ හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් **2026 නොවැම්බර් මස 26 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව. 9.30** සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

02. මෙහි සඳහන් නඩු භාණ්ඩ අතරින් යමකට හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතුය.

03. වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට කටයුතු කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එකී අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදින ප.ව. 4.00ට පෙර ඉවත් කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ හැකිය.

06. භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම්කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය.

පුස්සැල්ලගේ තයාගා අනුරාධි සිල්වා,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
බිබිල.

2026 ඔක්තෝබර් මස 30 වන දින,
බිබිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

වෙන්දේසි අංකය	*අනු. අංකය*	*නඩු අංකය*	*භාණ්ඩය*
01	01	67841	කුළු ගෙඩි 01 යකඩ කූරු 03 ගල් විදින කටු 02 මිට සහිත උදළු 01 කැට කූඩ 02
02	02	67896	Sendem TC IM Pdlzw Data Cable 02
	03	67898	Phone Cover 02
03	04	67894	මිට සහිත උදලු 02 වේ වැල් ගැරුම් වට්ටි 02 අලවංගු 02 පිහි 01 මුල්ලු 01

වෙන්දේසි අංකය	*අනු. අංකය*	*නඩු අංකය*	*භාණ්ඩය*
04	05	68449	වේවැල් ගැරුම් වට්ටි 01 කැට කූඩ 01
	06	67667	වේවැල් ගැරුම් වට්ටි 01
	07	67496	වේවැල් ගැරුම් වට්ටි 01
	08	67664	වේවැල් ගැරුම් වට්ටි 01
	09	68343	මිට සහිත කැති 01
05	10	67758	වේවැල් ගැරුම් වට්ටි 01 ප්ලාස්ටික් බාල්දි 01
	11	67873	වේවැල් ගැරුම් වට්ටි 01 ඇලුමිනියම් කොරොස් 01
	12	57589	වේවැල් ගැරුම් වට්ටි 01 ඉල්ලං කූරු 01
06	13	67928	සවල් 01 තහඩු බාල්දි 01
	14	68054	ප්ලාස්ටික් බාල්දි 01 කුඩා සල්ලඩ 01
	15	67755	ඉල්ලං කූරු 01
07	16	67986	මිට සහිත උදලු 01 ප්ලාස්ටික් තාච්චි 01
	17	68053	ඉල්ලං කූරු 01 මිට සහිත උදලු 01
	18	67217	සවල් 01
08	19	67423	මිට සහිත උදලු 01 ගැරුම් වට්ටි 01
	20	67759	මිට සහිත උදලු 01 කැට කූඩ 01
	21	68312	තහඩු බාල්දි 02
09	22	66009	කෘෂි කාර්මික පිහි 01
	23	62739	කෘෂි කාර්මික පිහි 02
	24	63792	කෘෂි කාර්මික පිහි 01
	25	68498	කෘෂි කාර්මික පිහි 01
	26	68499	කෘෂි කාර්මික පිහි 01

වෙන්දේසි අංකය	*අනු. අංකය*	*නඩු අංකය*	*භාණ්ඩය*
10	27	68096	බාල්දි 01 කැට කූඩ01
	28	67612	තහඩු බාල්දි 02
	29	67538	තහඩු බාල්දි 02
11	30	63554	සවල් 01
	31	64332	සවල් 01
	32	67859	තහඩු බාල්දි 02
	33	67874	තහඩු බාල්දි 02
12	34	63333	කෘෂිකාර්මික පිහි 01
	35	67822	සවල් 01 වේවැල් කැට කූඩ 01
	36	67613	සවල් 01
	37	66619	මිට සහිත උදලු 01
	38	67769	මිට සහිත පොරෝ 01
13	39	67541	තහඩු බැරල් 01
	40	66959	තහඩු බැරල් 01
14	41	මත් ද්‍රව්‍ය විනාශ කරන ලද හිස් බහාලුම්	ලීටර් 20 බූලි 11
	42	මත් ද්‍රව්‍ය විනාශ කරන ලද හිස් බහාලුම්	ලීටර් 10 බූලි 03
	43	මත් ද්‍රව්‍ය විනාශ කරන ලද හිස් බහාලුම්	ලීටර් 05 කෑන් 33
	44	මත් ද්‍රව්‍ය විනාශ කරන ලද හිස් බහාලුම්	විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් කල 06

මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2026 ඉවත් කරන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

01. මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2026.11.26 වන දින මධ්‍යාහ්න 12.00** ට පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ඩබ්ලිව්. එම්. එම්. අයි. වාසල,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
පිලැස්ස.

2026 ඔක්තෝබර් මස 30 වැනි දින,
පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

තත්ත්ව පරීක්ෂණ හා මිල කමිටු වාර්තාව අනුව භාණ්ඩ

අනු. අංකය	*භාණ්ඩය*	*ප්‍රමාණය*
01	කැබිනට් (වානේ)	01
02	අල්මාරි (වානේ)	03
03	පුටු අත් සහිත	02
04	පුටු කුෂන් (අමුත්තන් සඳහා)	02
05	හෙඩ්සෙට්	01
06	පරිගණක - (UPS) 1. 310034088BB7197802930 (DCP) 2. 310034088BB7197802932 (DCP) 3. 310034088BB7197802931 (DCP) 4. 530601191500155 (PROLINK) 5. 518501130506376 (PROLINK) 6. 518501171403822 (PROLINK)	06

අනු. අංකය	*භාණ්ඩය*	*ප්‍රමාණය*
07	මොනිටර් 1. HP - 6CM2190Z9H 2. SAMSUNG - MMLX3550093287D48D420 3. HP - (XJ313A) CN414104YO	03
08	CPU (DTVGYSG 005327035D79600)	01
09	Printer Brother E71077K5N268135	01
10	වැකුම් ක්ලීනර්	01
11	විදුලි සීනු	02
12	බෙල් රිමෝට්	01
13	චතුර මෝටරය	01
14	කොමඩ්	01
15	සින්ක්	02
16	ෆෑන්	04
17	(i) ට්‍යුබ් ලයිට් (ii) බල්බ්	02 03
18	කැඩී ගිය කොන්ක්‍රීට් කණු	08
19	ගේට්ටු පියන්	02
20	ඩවුන්ට් පයිප් හා බට කැබලි	02

රජයේ නොවන දැන්වීම්

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 34 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම

ද නිවාස චැරිටි (THE NIVASA CHARITY)

2007 අංක 07 දරන සමාගම් පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව, "THE NIVASA CHARITY" යන නාමයන්, එහි නාමයට "Limited" යන වචනය එකතු කිරීමකින් තොරව, ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කිරීමට අදහස් කරන බව මෙයින් මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.

යෝජිත සංවිධානය ලාභ නොලබන සංවිධානයක් වන අතර, එහි අරමුණු පහත පරිදි වේ.

01. විශේෂයෙන්ම ආර්ථික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයන්ට පත් වූ, අවදානමට ලක් වූ, අනාථ වූ හෝ වෙනත් ආකාරයකින් සහාය ලැබීමට සුදුසුකම් ඇති දරුවන්ගේ අධ්‍යාපනය සහ ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

02. දරුවන්ගේ අධ්‍යාපනය සහ සංවර්ධනය සඳහා අවශ්‍ය නොමිලේ අධ්‍යාපනික සහාය, ශිෂ්‍යත්ව, ප්‍රදාන, අමතර ඉගැන්වීම්, උපදේශනය, මාර්ගෝපදේශනය, අධ්‍යාපනික ද්‍රව්‍ය, පොත්පත්, නිල ඇඳුම්, උපකරණ, පරිගණක තාක්ෂණික සම්පත් සහ අනෙකුත් පහසුකම් සැපයීම.

03. අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථාන, පුස්තකාල, ඉගෙනුම් පහසුකම්, ළමා සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රජා ඉගෙනුම් වැඩසටහන් සහ වෙනත් ආයතන ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

04. දරුවන් සහ තරුණ තරුණියන් සඳහා අධ්‍යාපනික, සංස්කෘතික, විනෝදාත්මක, වෘත්තීය, ජීවන කුසලතා, භාෂා, සාක්ෂරතා, නායකත්ව සහ පෞද්ගලික සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම.

05. සංවිධානයේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලයන්, සංවිධාන, ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වෙතින් ප්‍රදාන, පරිත්‍යාග, අනුග්‍රාහකත්ව, ත්‍යාග, පරිත්‍යාග අරමුදල් සහ වෙනත් දායකත්වයන් ලබා ගැනීම.

06. සංවිධානයේ අරමුණු ඉටු කිරීම සඳහා රාජ්‍ය බලධාරීන්, අධ්‍යාපන ආයතන, පුණ්‍යායතන, ප්‍රජා කණ්ඩායම් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

07. ඉහත සඳහන් කවර කරුණක් නිබුණද, සංවිධානය විසින් කිසිදු ප්‍රාථමික පාසලක්, ද්විතීයික පාසලක් හෝ විධිමත් ප්‍රාථමික හෝ ද්විතීයික අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු නොකළ යුතුය.

යෝජිත සංවිධානයේ ලියාපදිංචි කාර්යාලය අංක 79සී, මාතර පාර, අහංගම, ශ්‍රී ලංකාව යන ලිපිනයේ පිහිටුවීමට නියමිතය.

මෙයින් මහජනතාව වෙත දැනුම්දෙනු ලබන්නේ, මෙම ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් විරෝධතා දක්වන ඕනෑම පුද්ගලයෙකුට, සමාගමකට හෝ සංස්ථාවකට, මෙම දැන්වීම පළ කළ දින සිට සති තුනක් (03) ඇතුළත සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, සමාගම් මැදුර, අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයට ලිපියක් මගින් සිය විරෝධතා ඉදිරිපත් කළ හැකි බවයි.

මොහොමඩ් අයිනාස් නිලාම්,
සමාගම් ලේකම්.

11- 59

ප්‍රසිද්ධ දැන්වීමයි

ට්‍රයිබ් අයි.එන්.සී. (පිවීටී) එල්ටීඩී (පිවී 00211087), ටුවෙන්ටි ටුවෙන්ටි එයිට් හෝල්ඩිංස් (පිවීටී) එල්ටීඩී (පිවී 00222039), ට්‍රයිබ් කිචන්ස් (පිවීටී) එල්ටීඩී (පිවී 00252101) සහ ස්ට්‍රීට් වොක් (පිවීටී) එල්ටීඩී (පිවී 00235448) යන සමාගම් ඒකාබද්ධ වීමේ නිවේදනයයි

ට්‍රයිබ් අයි.එන්.සී (පිවීටී), එල්ටීඩී ටුවෙන්ටි ටුවෙන්ටි එයිට් හෝල්ඩිංස් (පිවීටී) එල්ටීඩී, ට්‍රයිබ් කිචන්ස් (පිවීටී) එල්ටීඩී සහ ස්ට්‍රීට් වොක් (පිවීටී) එල්ටීඩී යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන් මත අදාළ සමාගම්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කොට, තවදුරටත් ට්‍රයිබ් අයි.එන්. සී. (පිවීටී) එල්ටීඩී යන නාමය යටතේ තනි සමාගමක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් අනුමත කරන දිනයක සිට ක්‍රියාත්මක වීමට නියමිතයි.

අධ්‍යක්ෂකවරු,

ට්‍රයිබ් අයි.එන්.සී. (පිවීටී) එල්ටීඩී (පිවී 00211087),
ටුවෙන්ටි ටුවෙන්ටි එයිට් හෝල්ඩිංස් (පිවීටී) එල්ටීඩී (පිවී 00222039),
ට්‍රයිබ් කිචන්ස් (පිවීටී) එල්ටීඩී (පිවී 00252101) සහ
ස්ට්‍රීට් වොක් (පිවීටී) එල්ටීඩී (පිවී 00235448).

11-63

ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් - සමාගම් ලියාපදිංචි අංකය PV 7277

2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය යටතේ ඇවරකරුගේ පත්වීමේ දැන්වීම

සමාගමේ නම	:	ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය	:	අංක 17, සමගි මාවත, බොරුපන පාර, රත්මලාන.
උසාවිය	:	බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරය, කොළඹ (සිවිල්)
නඩු අංකය	:	73/2021/CO(A)
ඇවරකරුගේ නම	:	ජෙරාඩ් ජීවානන්තන් ඩෙවිඩ්,
		ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ, අංක
ලිපිනය		100, බ්‍රේබෘක් පෙදෙස, කොළඹ 02.
පත්වීමේ දිනය	:	2026 ජුනි මස 30.

11-66/1

ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් - සමාගම් ලියාපදිංචි අංකය PV 7277

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ පරිවෘත්ත කිරීමේ නියෝගය

සමාගමේ නම	:	ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය	:	අංක 17, සමගි මාවත, බොරුපන පාර, රත්මලාන.
උසාවිය	:	බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, කොළඹ (සිවිල්)
නඩු අංකය	:	73/2021/CO(A)
නියෝගය දුන් දිනය	:	2026 ජුනි මස 30.
පෙත්සම ඉදිරිපත් කළ දිනය	:	2021 සැප්තැම්බර් මස 16.
ඇවරකරුගේ නම	:	ජෙරාඩ් ජීවානන්තන් ඩෙවිඩ්
ලිපිනය	:	ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ, අංක 100,
		බ්‍රේබෘක් පෙදෙස, කොළඹ 02.

11-66/2

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

මොන්ටි හොටෙල්
ගිණුම් අංකය : 0062 1000 0753

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2025.06.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එකසිය තිස් අට කෝටි හාර ලක්ෂ හැත්තෑ එක් දහස් හයසිය පනහයි ශත පනහක (රු. 1,380,471,650.50) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 804, 1266, 1556, 1787, 1905, 4893, 3684, 3961, 4397, 5889 සහ 4082 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකසිය විසි කෝටි හැට එක් ලක්ෂ හැට තුන් දහස් තුන්සිය දොළහයි ශත හැත්තෑ හතරක (රු. 1,206,163,312.74) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.01.16 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2026.01.13 දින "අයිලන්ඩ්" "තිනකුරල්" සහ සහ 2026.01.16 දින "දිවයින" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

2026.12.29 වන දින පෙ.ව. 10.00 ට,

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, නත්තරන්පොත, කුන්ඩසාලේ ග්‍රාමසේවා කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "කසුවිත්‍රෝ යයි දැන් කියනු ලබන සහ හඳුන්වනු ලබන ගම්මඩුව ගෘහ් හි තල්වත්ත එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. ඩී. දයාරත්න විසින් සාදන ලද 2005 ජුනි මස 17 සහ 2007 අගෝස්තු මස 10 දාතම හා අංක 1568A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (අංක 1475 දරන පිඹුරේ ලොට් 1) සහ බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 2 හි කොටසක්; නැගෙනහිරට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 3 හි කොටසක් සහ PP MAHA අංක 2206 දරන පිඹුරේ ලොට් 306 සහ 296 (වික්ටෝරියා ජලාශය); දකුණට: PP MAHA අංක 2206 දරන පිඹුරේ ලොට් 295 (වික්ටෝරියා ජලාශය) සහ බස්නාහිරට : තල්වත්ත එස්ටේට් හි කොටසක් - ගල්මඩුව ගෘහ් යන මායිම් තුළ පිහිටි සමස්ථ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිහයි දශම අටයි තුනයි පහක් (අ.1, රූ.3, පර්. 30.835) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1568A දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව D 345/71 යටතේ කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති අංක 1475 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 3 සහ අංක 1568 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති සියලුම යාබද ඉඩම් කොටස් හි ඒකාබද්ධයක් සහ නැවත මිනුමකි :

a. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කුණ්ඩසාලේ, නත්තරන්පොත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "කසුවිත්‍රෝ දැන් යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ගම්මඩුව ගෘහ් හි තල්වත්ත එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එම්. ඒ. බී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1993.04.21 දාතම හා අංක 1475 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 2 සහ 3 හි ඉතිරි ප්‍රදේශය සහ මෙම පිඹුරේ ලොට් 1 සහ 2; නැගෙනහිරට: මෙම පිඹුරේ ලොට් 2, බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ 3හි ඉතිරි ප්‍රදේශය සහ වික්ටෝරියා ජලාශය මගින් අත්පත් කර

ගන්නා ලද මෙම ඉඩමේ කොටසක්; දකුණට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 6406 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් දක්වා ඇති ඩී. එෆ්. අබේසේකර විසින් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක්, සහ වික්ටෝරියා ජලාශය මගින් අත්පත් කර ගන්නා ලද මෙම ඉඩමේ කොටසක් සහ බස්නාහිරට : ඩී. එම්. ඊ. එච්. අමරසේකර මහත්මිය විසින් හිමිකම් කියන වික්ටෝරියා ජලාශය මගින් අත්පත් කර ගන්නා ලද ගල්මඩුව ගෘෘජ් තල්වත්ත එස්ටේට් හි කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසි තුනයි දශම බිංදුවයි හතරක් (අ.1, රූ.3, පර්. 23.04) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව E 527/253 යටතේ කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

b. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුණ්ඩසාලේ නත්තරන්පොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "කසුවිත්‍රෝ දැන් යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ගම්මඩුව ගෘෘජ් හි තල්වත්ත එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එම්. ඒ. බී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1993.04.21 දාතම හා අංක 1475 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරේ ලොට් 1 සහ බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 1 සහ 3 හි ඉතිරි ප්‍රදේශය; නැගෙනහිරට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 3 හි ඉතිරි ප්‍රදේශය; දකුණට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 33 හි ඉතිරි ප්‍රදේශය සහ මෙම පිඹුරේ ලොට් 3 සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 1 සහ 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතරයි නවයක් (පර්. 7.49) විශාල ඉඩම් කොටස එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව E 527/254 යටතේ කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

c. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුණ්ඩසාලේ නත්තරන්පොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "ගම්මඩුව ගෘෘජ් හි තල්වත්ත එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. ඩී. දයාරත්න විසින් සාදන ලද 2007.08.10 දාතම හා අංක 1568 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 2 හි කොටසක්; නැගෙනහිරට : බලයලත් මානක තැන ආර්. එම්. ඒ. බී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1993 අප්‍රේල් මස 21 දාතම හා අංක 1475 දරන පිඹුරේ ලොට් 2 සහ 3 දැන් බලයලත් මානක තැන සී. ඩී. දයාරත්න විසින් සාදන ලද 2005 ජූනි මස 17 දාතම හා අංක 1128 දරන පිඹුරේ ඉඩම් කොටස; දකුණට : බලයලත් මානක තැන ආර්. එම්. ඒ. බී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1993 අප්‍රේල් මස 21 දාතම හා අංක 1475 දරන පිඹුරේ ලොට් 2 සහ 3 දැන් බලයලත් මානක තැන සී. ඩී. දයාරත්න විසින් සාදන ලද 2005 ජූනි මස 17 දාතම හා අංක 1128 දරන පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට : තල්වත්ත එස්ටේට් - ගල්මඩුව ගෘෘජ් හි කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනයි දශම හතයි තුනයි දෙකක් (රූ.1, පර්. 3.732) විශාල ඉඩම් කොටස එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව E 830/40 යටතේ කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුණ්ඩසාලේ, නත්තරන්පොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "කසුවිත්‍රෝ යයි දැන් කියනු ලබන සහ හඳුන්වනු ලබන ගම්මඩුව ගෘෘජ් හි තල්වත්ත එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එම්. ඒ. බී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1993.04.21 දාතම හා අංක 1475 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඩී. එම්. ඊ. එම්. අමරසේකර සහ දොස්තර ජයකොඩි විසින් හිමිකම් කියන ගල්මඩුව ගෘෘජ් තල්වත්ත එස්ටේට් හි කොටසක් සහ පොදු අඩි පාර සහ දොස්තර ජයකොඩි විසින් හිමිකම් කියන ගල්මඩුව ගෘෘජ් තල්වත්ත එස්ටේට් හි කොටක්; නැගෙනහිරට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 1 ඉතිරි ප්‍රදේශය; දකුණට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 3 හි ඉතිරි ප්‍රදේශය සහ මෙම පිඹුරේ ලොට් 2 සහ 3 සහ බස්නාහිරට : බලයලත් මානක තැන එල්. ඒ. ද සී. විජේතුංග විසින් සාදන ලද අංක 7501 දරන පිඹුරේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි නවයයි දශම එකයි හතක් (පර්. 29.17) විශාල ඉඩම් කොටස එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව D 345/72 යටතේ කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 804, 1266, 1556, 1787, 1905, 4893, 3684, 4397, 5889 සහ 4082 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොට්ඨාසයේ, පාතදුම්බර, උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මැණික්හින්න ප්‍රාදේශීය සභා සීමාවන් තුළ 684, නත්තරන්පොත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "තල්වත්තේ එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජී. එස්. කේ. ජයරත්න විසින් සාදන ලද 2007 දෙසැම්බර් මස 02 දාතම හා අංක 559/A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 559/A දරන මෙම පිඹුරේ ලොට් 3 (පාර); ඊසානට : ප්‍රධාන පාරේ සිට නිවාස දක්වා පාර; නැගෙනහිරට සහ දකුණට : ඒ. පාලිත විසින් හිමිකම් කියන තල්වත්ත එස්ටේට් කොටස වෙන්කෙරෙන කම්බි වැට සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (පර්. 15) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 559/A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 203/141 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොට්ඨාසයේ, පාතදුම්බර, උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මැණික්හින්න ප්‍රාදේශීය සභා සීමාවන් තුළ 684, නත්තරන්පොත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නත්තරන්පොත පිහිටි "තල්වත්තේ එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජී. එස්. කේ. ජයරත්න විසින් සාදන ලද 2007 දෙසැම්බර් මස 02 දාතම හා අංක 559/A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 558 දරන පිඹුරේ ලොට් 1 සහ අංක 557 දරන පිඹුරේ ලොට් 1; නැගෙනහිරට : ප්‍රධාන පාරේ සිට නිවාස දක්වා පාර; දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනක් (පර්. 3) (මීටර් 3.85 පළල පාර) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 559/A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 209/134 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3961 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-90

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. එස්. පෙරේරා
ගිණුම් අංකය : 1051 8100 1532

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2025.10.21 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි පනස් ලක්ෂ පනස් දහස් දෙසිය පනස් හතයි ශත හතළිස් අටක (රු. 15,050,257.48) මුදල ද, 2025 සැප්තැම්බර් මස 29 දින සිට අංක 4107 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි දහ අට ලක්ෂ අනූ පන් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හතළිස් හයක (රු. 11,895,374.46) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම බිංදුවක් (14.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.07.24 දිනරජයේ *ගැසට්පත්‍රයේ* 2026.08.03 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

2026.12.18 වන දින පෙ.ව. 9.30 ට,

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ ගැටඹේ - අංක 259 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිම්රෝස් ගාර්ඩන්ස් පිහිටි "පිම්රෝස්හිල් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. ඩී. අතපත්තු යන අය විසින් සාදන ලද 2018 අගෝස්තු මස 05 දාතම හා අංක 1034 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : මෙම පිඹුරේ ලොට් 01; ගිණිකොණට: බලයලත් මානක තැන ඒ. එම්. ඩී. අතපත්තු යන අය විසින් සාදන ලද අංක 913 දරන පිඹුරේ ලොට් 03; නිරිතට : බලයලත් මානක තැන ඒ. එම්. ඩී. අතපත්තු යන අය විසින් සාදන ලද අංක 913 දරන පිඹුරේ ලොට් 02 සහ මෙම පිඹුරේ ලොට් 01 සහ බලයලත් මානක තැන ඒ. එම්. ඩී. අතපත්තු යන අය විසින් සාදන ලද අංක 913 දරන පිඹුරේ ලොට් 03 සහ වයඹට : මෙම පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණුකොට ඇති අඩි 10 පළල පිවිසුම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම පහක් (A:0, R:0, P:9.5) හෝ හෙක්ටයාර 0.02403ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1034 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 637/150 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හතක් (A:0, R:0, P:1.7) හෝ හෙක්ටයාර 0.00431ක් විශාල ඉඩම් කොටස බලයලත් මානක තැන ඒ. එම්. ඩී. අතපත්තු යන අය විසින් සාදන ලද 2018 අගෝස්තු මස 05 දාතම හා අංක 1034 දරන පිඹුරේ නිරූපිත ලොට් 03 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

එකී ඉඩම සහ පරිශ්‍රයන් පහතින් විස්තර කොට ඇති ඉඩමෙන් බෙදූ කොටස්ය :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ ගැටඹේ - අංක 259 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිම්රෝස් ගාර්ඩන්ස්හි පිහිටි "පිම්රෝස්හිල් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. ඩී. අතපත්තු යන අය විසින් සාදන ලද 2017 සැප්තැම්බර් මස 24 දාතම හා අංක 913 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : බලයලත් මානක තැන ඒ. බී. කිරිදෙන යන අය විසින් සාදන ලද අංක 436 දරන පිඹුරේ ලොට් 47; ගිණිකොනට : අංක 913 දරන එකී පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණුකොට ඇති කානුව (අඩි 1 පළල); නිරිතට : එකී පිඹුරේ ලොට් 02; බස්නාහිරට : අරලිය මාවත සහ වයඹට : බලයලත් මානක තැන ඒ. බී. කිරිදෙන යන අය විසින් සාදන ලද අංක 436 දරන පිඹුරේ ලොට් 49 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතක් (A:0, R:0, P:20.7) හෝ හෙක්ටයාර 0.05237ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 637/07 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-92

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩී. එන්. වීරතුංග සහ එච්. ඒ. ටී. ජයකාන්ති
ගිණුම් අංක : 0021 5000 2381

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2026.04.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි තිස් දෙලක්ෂ දහ අට දහස් පන්සිය අසූ දෙකයි ශත හැත්තෑ දෙකක (රු. 23,218,582.72) මුදල ද, 2026 මාර්තු මස 03 දින සිට අංක 73, 69, 245, 886, 1217 සහ 2098 උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ හතර ලක්ෂයක (රු. 7,400,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) හා තවත් රුපියල් එක් කෝටි දහ හත් ලක්ෂ හැත්තෑ දෙදහසක (රු. 11,772,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.05.22 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2026.05.15 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

2026.12.21 වන දින පෙ.ව. 11.00 ට,

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන එම්. එච්. ටී. කරුණාරත්න යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත (මධ්‍යම) ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, නුවරගම් පළාත, කෙන්ද කෝරළේ, අනුරාධපුර මහ නගර සභා සීමාවන් තුළ සාලිය මාවත, අංක 318 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ වෝඩ් අංක 03, නුවරවැව (මිහින්තලේ පාර) පිහිටි "නුවරවැවකැළේ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ටී. ගලගෙදර විසින් සාදන ලද 2012 ඔක්තෝබර් මස 12 දාතම හා අංක 3111 දරන පිඹුරේ නිරූපිත එමෙන්ම අංක 3120 දරන පිඹුරේ ද නිරූපිත සීමා නිර්ණය කොට, බෙදා වෙන් කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ඇළ පාර; නැගෙනහිරට : අංක 2412 දරන පිඹුරේ ලොට් 02; දකුණට : අංක 2412 දරන පිඹුරේ ලොට් 04 (පාර); සහ බස්නාහිරට: මෙම පිඹුරේ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම අටයි බිංදුවක් (A:0, R:1, P:8.80) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3120 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 02 පහතින් විස්තර කොට ඇති ඉඩමේ උපබෙදුමක් සහ නැවත මිනුමක් වේ :

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත (මධ්‍යම) ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, නුවරගම් පළාත, කෙන්ද කෝරළේ, අනුරාධපුර මහ නගර සභා සීමාවන් තුළ සාලිය මාවත, අංක 318 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ වෝඩ් අංක 03, නුවරවැව (මිහින්තලේ පාර) පිහිටි "නුවරවැවකැළේ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2003 අප්‍රේල් මස 01 දාතම හා අංක 4032 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට, බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඇළ පාර; නැගෙනහිරට : අංක 2412 දරන පිඹුරේ ලොට් 02; දකුණට : අංක 2412 දරන පිඹුරේ ලොට් 04 (පාර); සහ බස්නාහිරට : ඇළ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහ හතරයි දශම පහයි බිංදුවක් (A:0, R:2, P:14.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4032 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව F 38/18 යටතේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

දේපළට පිවිසීම .-

අනුරාධපුර පුරාණ නගරයේ සිට නිවත්තකච්චේරිය පාර ඔස්සේ කිලෝ මීටර් 1.5ක් පමණ ඉදිරියට ගොස් පුත්තලම් - ත්‍රිකුණාමලය පාර (මාතලේ පාර ලෙසින් ප්‍රසිද්ධ) මුණගැසී මිහින්තලේ පාරට දකුණට හැරී තවත් මීටර් 200ක් පමණ මහින්ද විද්‍යාලය දක්වා ඉදිරියට ගමන් කරන්න. මහින්ද විද්‍යාලය පසුකරමින් ගුරු පාරට (හැපි ලියෝනි හොටෙල් වශයෙන් නාම පුවරුවක් ප්‍රදර්ශනය කොට ඇති) වමට හැරී, අභ්‍යන්තරයට ගමන් කොට මීටර් 500ක් පමණ මේ හරහා ගොස් උක්ත දේපළට ළඟා වන්න. උක්ත දේපළ මෙම පාරේ වම් අත පස පිහිටා ඇත.

ගෙවීම් ක්‍රමය .- වෙන්දේසි මිටිය පහළ වැටී මිල තීන්දුවනවාත් සමග සාර්ථක ගැනුම්කරු පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මුදලින් ගෙවිය යුතුය :-

(1) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
(2) අදාළ දේශීය අධිකාරියට ගෙවිය යුතු දේශීය බද්ද සියයට එකක් (1%) ;
(3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) ;
(4) අදාළ නම් වැට් ගාස්තු ;
(5) වෙනත් අදාළ ගාස්තු සහ අයකිරීම් ;
(6) ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අධිකාරියක් විසින් පනවන ලද ඕනෑම ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, බදු හෝ වෙනත් ගාස්තු සමග ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකුණුම් දිනයේ සිට දින 30ක් ඇතුළත පියවිය යුතු ය.

නිශ්චය කොට ඇති කාල පරිච්ඡේදය තුළ ඉතිරි මුදල පියවීමට අපොහොසත් වුවහොත්, 10% මූලික ගෙවීම අහිමි කොට වැඩිමනක් දැනුම්දීමකින් තොරව දේපළ නැවත විකිණීමට බැංකුවට හිමිකම් ඇත.

ඇමතුම් විස්තර :

වැඩිමනක් තොරතුරු සඳහා කරුණාකර අප අමතන්න :

අයකරගැනීම් දෙපාර්තමේන්තුව,
සම්පත් බැංකුව, අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 02.
දුරකථන : 011-441 6237

පූර්ව දැනුම් දීමකින් තොරව, වෙන්දේසිය තාවකාලිකව අත්හිටුවීමට, කල්තැබීම හෝ අවලංගු කිරීම බැංකුව සතු හිමිකම් වේ.

එම්. එච්. ටී. කරුණාරත්න,
මෙසස් ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි
බලයලත් වෙන්දේසිකරු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-94

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 වන අධිකාරය) හා එහි සංශෝධනයන්හි 22 වන වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැනුම්දීම

1. ස්ථිර අයිරා අංකය: 86957730

කොළඹ 05, කිරුළපන පාර, අතුල පෙදෙසෙහි, අංක 15/5හි කුඩාකෝන් ඩිසයින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ශන් (පුද්ගලික) සමාගමේ එක් අධ්‍යක්ෂවරයකු වන රාගම, බටුවත්ත, ලියන වත්ත, අංක 265/B/3හි පදිංචි චක්‍රවර්ති චිත්‍රා මානෙල් කාන්ති මහත්මියගේ උකස් කරන ලද දේපළ විකිණීම.

2. 2026.07.24 වන දින අංක 2499 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්පත්‍රයේ* සහ 2026.10.07 වන දින ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකු ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකුණනු ලබන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය, දේපළ පිහිටා ඇති ස්ථානයේදීම,

2026.12.11 වන දින ප.ව. 2.30 ට,

කොළොන්නාව, විහාර මාවත, අංක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර එම්.එච්.ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල (බටුවත්ත උපකාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව හා ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 213 බටුවත්ත බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටුවත්ත ග්‍රාමයේ පිහිටා ඇති ආතර් පෙරේරා පාරේ වරිපනම් අංක 42/13 දරන "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 2013 අගෝස්තු 23 වන දිනැති අංක 19430 දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් B3 ලෙස ලකුණු කර, බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් B3; උතුරට: ලොට් B4 ද; නැගෙනහිරට : ලොට් R1 ද; දකුණට : ලොට් B2 ද; බස්නාහිරට: පී.ඒ.ඩී.ටී. කුසුමලතා හා පී.ඒ.ඩී.කේ. නෙවිල් යන අයගේ ඉඩම් ද මායිම්ව පර්චස් දහයක (අ.0-රූ.0-පර්.10) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම අංක 19430 දරන එකී පිඹුර අනුව එහි ඇති පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා සියලු දේ සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ J209/11 හි ලියාපදිංචි කර ඇත.

තවද, අංක 19430 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් R1 හා R2 (මාර්ග වෙන්කිරීම)හි මාර්ග පරවශසතා අයිතිය සමග වේ.

1. ගෙවීම් කරන ආකාරය -

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතු ය.

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද ;
1.2 වැට් (VAT) බදු අයකරගැනීම් (අදාළ වේ නම්) ද ;
1.3 විකුණුම් බද්ද ලෙස පළාත් පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද ;
1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද ;
1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකරගැනීම් වෙතොත් ඒ සැම;
1.6 වෙනත් ගාස්තු/අයකරගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10%ක් (සියයට දහයක්) ද ගැනුම් මිලෙහි ඉතිරි 80% විකුණනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. ඊට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම්, වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තකකිරීමේ සහ දේපළ නැවත වෙන්දේසිකිරීමේ අයිතිය බැංකුව සතුය.

2. දේපළ වෙත ප්‍රවේශ වන ආකාරය:

රාගම සිට ගනේමුල්ල පාරේ බටුවත්ත දුම්රිය ස්ථානය දක්වා ගොස්, එතැනින් කඳාන පාරට වමට හැරී මීටර් 600ක් පමණ යන්න. ඉන්පසු ආතර් පෙරේරා මාවතට දකුණට හැරී මීටර් 400ක් පමණ යන්න. අවසානයේ ගල්තාර අතුළ පාරට දකුණට හැරී මීටර 200ක් පමණ ඉදිරියට ගිය විට, දෙවන වංගුවේ දකුණු පැත්තේ අදාළ දේපළ පිහිටා තිබේ.

ලංසුකරුවන්ට ඉහත සඳහන් දේපළට අදාළ නිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන 0112960892 යන දුරකථන අංකය ඔස්සේ ලංකා බැංකුවේ බටුවත්ත ශාඛාවේ කළමනාකරු සම්බන්ධ වී පරීක්ෂා කිරීමට නිදහස ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ.කේ.එස්. ප්‍රේමසිරි,
කළමනාකරු.

ලංකා බැංකුව,
බටුවත්ත ශාඛාව.

11-83

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 වන අධිකාරය) 22 වන වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැනුම්දීම

පහසුකම් යොමු අංක - 87907539 සහ 87907618

1. කටාන, කටාන නැගෙනහිර, දුරියන්ගස් හන්දිය, අංක 164/B/4හි ජයසිංහ ආරච්චිගේ මධුෂ්කා මහේෂි මහත්මියගෙන් අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2026.10.23 වන දින 2512 දරන *ගැසට් පත්‍රයේ* හා 2026.10.16 වන දින "ඩේලිනිව්ස්" "තිනකරන්" හා "දිනමිණ" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් අයිරා පහසුකම ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම

2026.11.20 දින පෙ.ව 09.30 ට,

කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එව් ඔක්ෂන් හි වෙන්දේසිකාර එම්.එච්.ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

ඉහත උකස් බැඳුම්කරයන් හි සඳහන් උපලේඛනය

ඉඩමේ විස්තර:

(අ) දිස්ත්‍රික්කය : ගම්පහ
(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : කටාන
(ඇ) ග්‍රාම නිලධාරි වසම : කටාන නැගෙනහිර
(ඈ) ගම හෝ නගරය : කටාන නැගෙනහිර
(ඉ) විදිය : -
(ඊ) වරිපනම් අංකය : -
(උ) කැඩැස්තර සිතියම් අංකය : 511206
(ඌ) බ්ලොක් අංකය : 03
(එ) ඉඩම් කැබලි අංකය : 0072
(ඒ) ප්‍රමාණය : හෙක්ටයාර 0.0455
(ක) සහාධිපත්‍ය දේපළක් නම්, ඒකකයේ අංකය: -

පෙර ලියාපදිංචි කිරීමේ යොමුව:

(අ) ලියාපදිංචි කළ ස්ථානය : මීගමුව
(ආ) කොට්ඨාසය : -
(ඇ) වෙළුම් අංකය : -
(ඈ) පත් ඉරු අංකය : -
(ඉ) හිමිකම් සහතික අංකය : 00052545052
(ඊ) හිමිකම් පන්තිය : පළමු පන්තිය

ලංසු තබන්නන් හට පවතින හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීමට නිදහස ඇති අතර, ඉහත දේපළ සම්බන්ධ අනෙකුත් සම්බන්ධිත ලේඛන පරීක්ෂා කිරීම කළමනාකරු, ලංකා බැංකුව, වයික්කාල ශාඛාව දු.ක - 037-2277280 මගින් සිදුකළ හැක.

ගෙවීම් කරන ආකාරය - වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය:

1.1 මිලදී ගන්නා මිලෙන් 10% (සියයට දහයක්) ද ;
1.2 වැට් (VAT) බදු අයකරගැනීම් (අදාළ වේ නම්) ද ;
1.3 විකුණුම් බද්ද ලෙස ප්‍රාදේශීය පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද ;
1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද ;
1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකරගැනීම් වෙතොත් ඒ සැම;
1.6 ගාස්තු හා වෙනත් අයකරගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලෙන් තවත් 10%ක් (සියයට දහයක්) ද ගැනුම් මිලෙහි ඉතිරි 80% විකුණනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. ඊට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තකකිරීමේ සහ දේපළ නැවත වෙන්දේසිකිරීමේ අයිතිය බැංකුව සතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එව්. ඩී. කේ. ජේ. විමලරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
වයික්කාල ශාඛාව.

11-84

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 වන අධිකාරය) 21 වන වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැනුම්දීම

පහසුකම් යොමු අංකය:- 81838330

මහගිරිල්ල, උඩගිරිල්ල, "ශ්‍රී සඳ" යන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ මල්ලිකා හේරත් මහත්මිය, දිසානායක මුදියන්සේලාගේ රන්ජන් සිසිර කුමාර දිසානායක මහතා සහ දිසානායක මුදියන්සේලාගේ ප්‍රියන්ත හිරාන් බන්දුල කුමාර දිසානායක මහතා යන අයගේ උකස් කරන ලද දේපළ විකිණීම.

2023.08.11 වන දින අංක 2345 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්පත්‍රයේ* සහ 2023.08.08 වන දින "දිනමිණ", "ඩේලිනිව්ස්" හා "තිනකරන්" යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකු ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකුණනු ලබන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපළ,

2026.11.23 වන දින පෙ.ව. 11.00 ට,

අදාළ දේපළ පිහිටා ඇති ස්ථානයේදීම කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර එම්.එච්.ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහයෙ කෝරළේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බමුණුවල ග්‍රාම නිලධාරී වසමේ බමුණුවල පිහිටා ඇති "පින්වලපිටියේ වත්ත" නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්.කේ. පෙරේරා විසින් සාදන ලද 2003.07.09 දිනැති අංක 952 දරන පිඹුරේ ලොට් 178 ලෙස නිරූපණය කර, බෙදා වෙන් කර, විස්තර කොට ඇති ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 178, එකී පිඹුර අනුව, උතුරට: ලොට් 76 (මීටර් 6ක් පළල පාර) ද; නැගෙනහිරට: ලොට් 52 (මීටර් 6ක් පළල පාර) ; දකුණට: ලොට් 179 ද; බස්නාහිරට: ලොට් 177 ද මායිම්ව පර්වස් පහළොවක (අ.0-රූ.0-පර්.15) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමග වේ. තවද, අංක 952 දරන එකී පිඹුරේ ලොට් 52, 76 හා 13 යනුවෙන් ලකුණු කර ඇති මාර්ග භාවිතකිරීමේ අයිතිය ද සමඟ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ G 209/104 හි ලියාපදිංචි කර ඇත.

ලංසුකරුවන්ට ඉහත සඳහන් දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන, ලංකා බැංකුවේ නිකවැරටිය ශාඛාවේ කළමනාකරු සම්බන්ධ වී පරීක්ෂා කිරීමට නිදහස ඇත. දුරකථන අංකය: 037-2260922

ගෙවීම් කරන ආකාරය -
